# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013

(නව නිර්දේශය)

2016 අගෝස්තු - ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

සිංහල - **SINH - E 3025**

භාෂා පරිණාමය, පුරාක්ෂර විද්‍යාව හා කලාශිල්ප

**පළමු කොටසේ පළමු වන ප්‍රශ්නය ද, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.**

**කාලය : පැය 03 යි.**

---

### I කොටස

1. පහත සඳහන් ශිලාලිපි පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.

පරුමක නග පුත අසලිය ලෙණෙ අගත අනගත චතුදිශික සගයෙ

බඩකරික පරුමක තිශ පුත පරුමක අශඩ ගුතහ ලෙණෙ

කණගම ර(ඣශ) තිශහ ඣිත ශවෙර ශමණිය ලෙණෙ ශගශ

පරුමක නමලි ශුමන පුත පරුමක නමලිය ලෙණෙ ශගශ

පරුමක ගුත පුත පරුමක ශුමනහ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ

(ලකුණු 10 යි)

11. සැත් බිය නෙරැ නත් ජැයින් නන්සෙය් බුද්
බන්ද් කරය් සියල් ඉසිරැයෙන් පුජය් දා සැණෙන්
බුද්රුවන් අරියය් ධමුරුවන් කවරි සෙයකින් පුජනෙම් හො
යන අදහස් පුරය් අභිධම් දෙසුන් කසුන්
පත් අරවය් මහ පුජැ කොට් සසුන් සිට්වම් යන සිත් දොළ්නෙන්
ඈජර පය හමුයෙහි එ මෙ ධම්දෙසුන් වියක්
හත් කළ සිය බස්නෙන් බුද් ගුණ වැනූ රිවි අන්වයෙන් බට්
සැහැකුල කොත් ඔකා රජ්කුලට් තලාටික් අප පුරමු
වො තුමන් සත්ලැගු සවන හවුරුදුයෙහි අභයගිරි වෙහෙරැ
කපාරාමුළට් සලමෙය්වන් පවු කරය් සඟුන්
වසවය් සතර පස සුලබ්කොට් මෙමෙ නකය් අබදි අවසට් මෙ
සිරිත් තැබැවූහු

(ලකුණු 10 යි)

111. මෙ හොපිටිගමුපදි ලද් කෙනෙකුන්
ගැත්තන් ගමට් ආ කලැ මන්‍දඩින් වණිග්‍රාම (ය)
න් මහාග්‍රාමයන් හින්‍ද සතලොසැ පිරිනිවියන්
වහන්සෙ දවසැ වැවස්ථා සේ පෙරෙ සිරිත්
දඩ ගනුත් මිසැ අනියා නො කරනු ඉසා
ගම්ලද්දන් ගැත්තන් මන්‍දඩින් හින්‍ද විතාර
කොට පිරිකපා ත(බා) දුන් දඩ ගනුත්
මිසැ ගම වටා ගෙනැ ගෙ තිරැ ගෙනැ දඩ
නො එළ්වනු ඉසා දඩ ගැමැ හින්‍ද එ (ළ්) වත්
මිසැ කුඩින් ගැමින් පිටත් කොට
නො ගෙනැ යනු ඉසා නොපිරිකැපූ දඩට
වැලැක්මෙ නො ගන්නා කොට ඉසා

(ලකුණු 10 යි)

1v. ශ්‍රී සිරිබර් කැත්කුල කොත් ඔකාවස් රජ්පරපුරෙන්
බට් කැත්උසබ්නට් අග්මෙහෙසුන්වූ ලක්දිව් පොළො
යෝන පරපුරෙන් හිමිවූ සිරිසඟ්බො අභා මහරජ්හු පුත්
සිරිසඟ්බො අභය් මහරජ්හු සත් ලැගු (නව)වන
හවුරුදුයෙහි උන්ද්වප් සන්ද් පෙරෙ අඩි(ම)ස්හි ද(ස)
පක් දවස් උතුරු පසැ අම්ගම්කුළියෙහි කිබි(නිල)
මිහි දෙමෙළ්වෙහෙර් පමණියෙන් දසගමට් එකෙක
නායකයන් කිබිගම් ඇප දුන් නායකයන් කුඩීන්
මෙහි ඇතුළත්තාක් තැනැ කුහිවකු මරා කෙ(ටුව)
කඬපළා සොරකම් කළ තිරැ කොට් ගෙනැ දස
ගැමැ ඇත්තන් හින්‍ද විචාරා උපන් දූයට් පෑ
හැකිසේ ලියා තබා මැරුවෙහු මරා පට්වනු කොට් ඉසා (ලකුණු 10 යි)

හෝ

පහත සඳහන් ශිලාලිපි කියවා වර්තමාන අකුරින් ලියන්න.



(ලකුණු 10 යි)

## II කොටස

02. සිංහල භාෂා ඉතිහාසය සම්බන්ධ යුග වර්ගීකරණයන් පිළිබඳ විද්වත් මත සමාලෝචනය කොට ගයිගර්ගේ යුග වර්ගීකරණයට අනුව මධ්‍යකාලීන සිංහල යුගයේ භාෂා ලක්ෂණ පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 15 යි)

03. පුරාතන හා නූතන සිංහල භාෂා ව්‍යවහාරය තුළ ද්‍රාවිඩීය භාෂා ලක්ෂණ කොතෙක් දුරට විද්‍යමානවේද'යි පිරික්සන්න. (ලකුණු 15 යි)

04. ''ලංකාවේ ලේඛන කලාවේ ආරම්භය ක්‍රි.පූ 3 වන සියවසේ සිද්ධ වූවකි.'' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 15 යි)

05. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ කෙටිසටහන් ලියන්න.

1. අශෝක බ්‍රාහ්මී අක්ෂර මාලාවේ රූපීය ස්වභාවය
11. 5 කාශ්‍යපගේ අනුරාධපුර පුවරු ලිපිය
111. සිංහල ප්‍රාකෘත යුගයේ භාවිත බ්‍රාහ්මී අක්ෂර මාලාව
1v. සිංහල භාෂාව කෙරෙහි ඉංග්‍රීසි භාෂාවෙහි බලපෑම (ලකුණු 15 යි)

හෝ

'ඉපැරැණි අධිකරණ හා දඬුවම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයක දී වේවැල්කැටිය ශිලාලිපිය ප්‍රශස්ත මූලාශ්‍රයක් වෙයි' විමසන්න. (ලකුණු 15 යි)

## III කොටස

06. ''මහින්දාගමනය ශ්‍රී ලාංකේය ශිල්ප කලාවන්හි ප්‍රාරම්භක අවස්ථාවයි.'' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 15 යි)

07. බුදු පිළිමයේ ප්‍රභවය පිළිබඳ විද්වත් මත සමාලෝචනය කොට ශ්‍රී ලංකේය බුද්ධ ප්‍රතිමා කලාවේ විශේෂ ලක්ෂණ පහදන්න.

(ලකුණු 15 යි)

08. ශ්‍රී ලාංකේය බෞද්ධ ස්තූප කලාව විවිධ අකෘතික ලක්ෂණ සහිතව විකාසනය වූ ආකාරය පහදන්න.

(ලකුණු 15 යි)

09. මහනුවර යුගයේ චිත්‍රකලා සම්ප්‍රදායට ආවේණික සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 15 යි)

10. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ කෙටිසටහන් ලියන්න.

1. සඳකඩපහණ
11. අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාව
111. නුවර යුගයේ ටැම්පිට විහාර
1v. කැලණි විහාරයේ චිත්‍ර

(ලකුණු 15 යි)